# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2026 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

---

සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම ව්‍යාපාර පරිසරය විෂයයේ I වන අදියරේ නිශ්චිතව දක්වා ඇති සියලුම ක්ෂේත්‍ර ආවරණය කර ඇති බැවින්, අයදුම්කරුවන්ගේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමස්ත දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම අරමුණ විය. සමස්තයක් වශයෙන්, බොහොමයක් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක වූ අතර අනෙක් අය හොඳින් පිළිතුරු සැපයීමට අපොහොසත් වී තිබුණි. අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා ඇති ආකාරය නිරීක්ෂණය කිරීමෙන්, ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීම සඳහා ප්‍රශ්න තේරුම්ගෙන පිළිතුරු සැපයීමේදී ගැටළු වළක්වා ගැනීම වැදගත් බව අවබෝධ විය.

ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

### A කොටස

### ප්‍රශ්න අංක 01

ව්‍යාපාර පරිසරය විෂයයේ සමස්ත ක්ෂේත්‍ර මෙම අංශයෙන් ආවරණය කර ඇති අතර සියලුම අයදුම්කරුවන් පාහේ මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් **1.1, 1.4, 1.8, 1.16** සහ **1.17** යන ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි. ප්‍රශ්න සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත පරිදි වේ:

1.1 පෞද්ගලික සීමිත සමාගමක උපරිම කොටස් හිමියන් සංඛ්‍යාව පිළිබඳව අයදුම්කරුවන් දැනුවත්ව නොසිටි අතර, ඔවුන් පිළිතුරු දී ඇත්තේ කොටස් හිමියන් 50 ක් වෙනුවට 20 ක් ලෙසය.

1.4 බොහොමයක් අයදුම්කරුවන් මුදල් වෙළඳපොළේ භාවිතා නොකරන උපකරණය හඳුනාගෙන නොතිබූ අතර ඔවුන් "භාණ්ඩාගාර බැඳුම්කර" (3) වෙනුවට "භාණ්ඩාගාර බිල්පත්" (3) ලෙස පිළිතුරු සපයා ඇත.

1.8 අයදුම්කරුවන් හිස් පිටසන පිළිබඳව නොදැන සිටි අතර නිවැරදි පිළිතුරු අංකය (3) වෙනුවට පිළිතුරු අංකය 4 ලෙස සලකුණු කර තිබුණි.

1.16 අයදුම්කරුවන්ගෙන් බහුතරයක් "විධිමත් සංවිධානය" පැහැදිලි කර තිබුණද, ඔවුන් උදාහරණයක් සපයා නොතිබුණි. එබැවින්, ලකුණු 2 න් 1 ක් පමණක් ලබාගැනීමට සමත්ව තිබුණි.

1.17 අයදුම්කරුවන් කිහිප දෙනෙකු හොඳ මුදලක ලක්ෂණ හඳුනාගෙන නොතිබූ අතර ඔවුන් හොඳ මුදලක කාර්යයන් සඳහා පිළිතුරු සපයා තිබුණි. ලකුණු ලබාගත් අයදුම්කරුවන් සාමාන්‍යයෙන් සාමාන්‍ය පිළිගැනීම, බෙදීමේ හැකියාව, කල්පැවැත්ම, ගෙන යාමේ පහසුව යනාදිය සඳහන් කර තිබුණි.

කෙසේවෙතත්, ඉහත ප්‍රශ්න හැර, බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට හොඳින් උත්තර ලියා තිබුණි.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න හතරකින් සමන්විත විය. සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් ලබා දී තිබුණි.

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය "කේවලස්වාමි ව්‍යාපාර", "හවුල් ව්‍යාපාර" සහ "සීමිත වගකීම් සමාගම" යන මාතෘකා මත පදනම් විය.

**(a)** DK Juce Bar ව්‍යාපාරයක් ලෙස වර්ගීකරණය කළ හැකිද යන්න පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටියේය. බොහොමයක් අයදුම්කරුවන් මෙය හවුල් ව්‍යාපාරයක් ලෙස හඳුනා ගත්හ. කෙසේ වෙතත්, සමහර අයදුම්කරුවන් එය පොදුවේ ව්‍යාපාරික සංවිධානයක් ලෙස හඳුනාගෙන ඇති අතර, දී ඇති අවස්ථාවට ලක්ෂණ සම්බන්ධ කිරීම වෙනුවට එහි ලක්ෂණ විස්තර කර ඇත.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් හවුල් ව්‍යාපාරයක් සහ කේවල ස්වාමි ව්‍යාපාරයක් අතර වෙනස්කම් නිවැරදිව සඳහන් කර තිබුණි..

**(c)** අයදුම්කරුවන් සාමාන්‍යයෙන් හවුල් ව්‍යාපාරයක් පෞද්ගලික සීමිත වගකීමක් සහිත ව්‍යාපාරයක් සමඟ සංසන්දනය කර එහි වාසි සරල ආකාරයකින් පැහැදිලි කළහ . කෙසේ වෙතත්, අයදුම්කරුවන් සුළු පිරිසක් ප්‍රශ්නය නිසි ලෙස කියවා නොගෙන එය කේවල ස්වාමි ව්‍යාපාරයක් සමඟ සංසන්දනය කර තිබුණි.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 03

**(a)** අයදුම්කරුවන් විවිධ රක්ෂණ ඔප්පු වර්ග ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, සමහර අයදුම්කරුවන් ප්‍රධාන රක්ෂණ ඔප්පු වර්ග දෙක වන ජීවිත රක්ෂණය සහ දේපළ රක්ෂණය සඳහන් කරමින් පිළිතුරු දුන්හ. මෙය ඔවුන්ගේ සාමාන්‍ය දැනුම භාවිතා කිරීමෙන් පිළිතුරු දිය හැකි ප්‍රශ්නයකි.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් රක්ෂණ මූලධර්මය නිවැරදිව සඳහන් කර ඇත. වන්දි, ආසන්නතම හේතුව, උපරිම සද්භාවය සහ රක්ෂ්‍ය හිමිකම සඳහන් කර ලකුණු ලබාගෙන තිබුණි.

**(c)** අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දී ඇත්තේ අංශ දෙකක් සාකච්ඡා කරමිනි:

- ව්‍යාපාර සඳහා රක්ෂණයේ වැදගත්කම.
- ආර්ථික සංවර්ධනය සඳහා රක්ෂණයේ වැදගත්කම.

රක්ෂණයේ වැදගත්කම පිළිබඳ අයදුම්කරුවන්ගේ ප්‍රායෝගික දැනුම සාපේක්ෂව අඩු බව පෙනී යයි.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය අපනයන වෙළඳාමේ නියැලී සිටින සමාගමක් මත පදනම් වූ අතර මෙම ප්‍රශ්නය උපකාරක සේවාවන්හි ඇතුළත් සැපයුම් සේවාවන් පරීක්ෂා කරන ලදී.

**(a)** ඵලදායී ප්‍රවාහන හා සැපයුම් සේවා සඳහා සලකා බැලිය යුතු සාධක බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව හා ප්‍රායෝගිකව සඳහන් කර ඇත්තේ සැපයුම් පද්ධතියක් තිබීම ලෙසයි. අයදුම්කරුවන් විසින් සපයන ලද නිවැරදි පිළිතුරු වූයේ ප්‍රවාහනය, පිරිවැය, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, තොග කළමනාකරණය යනාදියයි.

**(b)** බෙදා හැරීමේ මාර්ග නිසි ලෙස කළමනාකරණය නොකළහොත් සිදුවිය හැකි අවාසි පිළිබඳ ප්‍රායෝගික අවබෝධය මෙම කොටසින් අයදුම්කරුවන්ගෙන් පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට විවිධ දෘෂ්ටිකෝණවලින් පිළිතුරු සපයා ඇත. බහුතරයක් "ලාභ අහිමි වීම", "කීර්ති නාමය අහිමි වීම", "නීතිමය පිරිවැය වැඩි වීම" යනාදිය පැහැදිලි කර තිබුණි.

**(c)** ජාත්‍යන්තර වෙළඳාම යටතේ "ඒකපාර්ශ්වික වෙළඳ ගිවිසුම" යන යෙදුම පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටි අතර, අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් පමණක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

**සමස්තයක් ලෙස, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආයතනික පාලනය මත පදනම් විය.

**(a)** ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයක් ලෙස දී ඇති සංවිධානයේ කාර්ය සාධනය වැඩිදියුණු කළ හැකි ආකාර තුනක් සඳහන් කරන ලෙස ඉල්ලා සිටියේය. අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුමෙන් මෙයට පිළිතුරු දිය හැකිව තිබුණි. කෙසේවෙතත්, නිශ්චිත පිළිතුරු ලබා දී තිබුනේ අයදුම්කරුවන් සුළු සංඛ්‍යාවක් පමණි.

**(b)** ප්‍රායෝගික අංශ සලකා බලා, රජය ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය බොහොමයක් අයදුම්කරුවන් සාර්ථකව පැහැදිලි කළහ.

**(c)** මෙම කොටසින් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කළේ  අයදුම්කරුවන් ප්‍රධාන අංශ හතරක් යටතේ කොටස්කරුවන් කෙරෙහි සමාජ වගකීම ඉටු කිරීම පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කිරීමයි. අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් සම්පූර්ණ නිවැරදි පිළිතුරු සපයා නොතිබුණි.

ස්ව-අධ්‍යයන පොතට අනුව අපේක්ෂා කළ පිළිතුරු වලට සමාන පිළිතුරු බහුතරයක් සපයා තිබුණි.

**සමස්තයක් ලෙස, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## C කොටස

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය පදනම් වූයේ, අපනයන වෙළඳාම මූලික කර ගත් කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ නියැලී සිටි එම විශේෂිත සංවිධානය, බහුවිධ අභියෝග සමඟින්, ලබා දී ඇති අවස්ථාව මත ය. සංවිධානයේ ශක්තීන්, වෙළඳපොලේ ඇති අවස්ථා සහ ආයතනය අභ්‍යන්තරව සහ බාහිරව මුහුණ දෙන අභියෝග පිළිබඳව විශාල දත්ත ප්‍රමාණයක් ලබා දී තිබුණි.

**(a)** ශදූඅත (SWOT) විශ්ලේෂණය භාවිතයෙන් ව්‍යාපාරික පරිසරය තක්සේරු කරන ලෙස ඉල්ලා සිටි අතර, අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නඩුවෙන් SWOT සාධක නිවැරදිව හඳුනාගෙන ලකුණු ලබාගෙන තිබුණි.

**(b)** ගෝලීය ව්‍යාපාරික පරිසරය ආයතනයේ ව්‍යාපාරයට බලපාන ආකාරය පිළිබඳව පැහැදිලි කිරීම් දෙකක් ඉල්ලා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම නඩුවට අදාළ පිළිතුරු ලබා දීමට උත්සාහ කර තිබුණි. සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු ලබා දී තිබුණද, ගෝලීයකරණය ව්‍යාපාරයට බලපාන ආකාරය පිළිබඳව සමහරුන්ට පැහැදිලි අවබෝධයක් නොතිබුණි. ගෝලීයකරණයේ සාමාන්‍ය බලපෑම් සහ මෙම ප්‍රශ්නයට සෘජුවම සම්බන්ධ නොවන සමහර කරුණු පමණක් බහුතරයක් සඳහන් කර තිබුණි.

**(c)** ප්‍රවාහන පද්ධතියක මූලිකාංග සඳහන් කරන ලෙස ඉල්ලා සිටි අතර බහුතරයක් නිවැරදිව පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව කියවා තේරුම් ගෙන ප්‍රවාහන පද්ධතිවල වාසි සටහන් කර නොතිබුණි.

**(d)** අයදුම්කරුවන් විසින් ලබා දී ඇති ආයතනයට ඵලදායී ප්‍රවාහන පද්ධතියක වාසි නිසි ලෙස ප්‍රකාශ කර තිබූ අතර බොහෝ අයදුම්කරුවන් ලකුණු ලබාගෙන තිබුණි.

**(e)** බොහොමයක් අයදුම්කරුවන් ව්‍යවසායකත්වයේ සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ නිවැරදිව පැහැදිලි කර තිබූ අතර, ඉතා සුළු පිරිසක් පමණක් එම ක්ෂේත්‍රය පිළිබඳ පැහැදිලි අවබෝධයකින් තොරව පිළිතුරු ලබා දී තිබුණි.

**සමස්තයක් වශයෙන්, මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

---

## <u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>

(1) ප්‍රශ්ණ පත්‍රය ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවීම. (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(2) AAT විෂය නිර්දේශය/පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා, ලිවිය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා සෘජු කෙටි උත්තර අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගත යුතුය.

(5) පිළිතුරු සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කල භාෂාවයි. සෑම නව ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු සැපයීම ආරම්භ කලයුත්තේ පිළිතුරු පොතේ අළුත් පිටුවකය. අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබිම ගැන සැළකිලිමත් විය යුතුය.

(6) උත්තර පත බාරදීමට පෙර සෑම පිටුවකම ප්‍රශ්න අංක සහ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(7) "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(8) දැනුම වැඩිදියුණු කරගැනීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(9) ඒඒටි ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(10) කිසිදු ප්‍රශ්නයක් මගහැරීම නොකලයුතුය. මෙම පුරුද්ද විභාගය අසමත් වීමට හේතුවක් විය හැක.

(11) හොඳ සූදානමකින් සහ විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීය යුතුය.

- * * * -